# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ඉඩම් අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2018**

බලයලත් සැලසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ ;

I වැනි කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
II වැනි කොටස - පිඹුරු වැඩ

2. විභාගයේ පළමුවැනි කොටස 2018 ජූලි මස 21 වැනි දින දී ද, දෙවෙනි කොටස 2018 ඔක්තෝබර් මස 13 හා 14 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවෙනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත්වන අපේක්ෂකයින්, බලයලත් සැලසුම් ශිල්පීන් සඳහා වන සර්වේයර් ජනරාල්ගේ සහතිකය

ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතුය.

(අ) ක්ෂෙත්‍ර සටහනක් මගින් ඛණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් ඛණ්ඩාංක කිරීමට ;
(ආ) කෝණමානය භාවිතයෙන් හා ඛණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂෙත්‍රඵලය ගණනය කිරීමට.

4. *විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්:*

(අ) ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම ;

සහ

(ආ) රජයේ කාර්මික විද්‍යාලයක හෝ වෙනත් අර්ධ රාජ්‍ය ආයතනයක, අවුරුද්දකට නොඅඩුවූ කාල සීමාවක් සහිත, සැලසුම් ශිල්පය හා සම්බන්ධ පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

*5. විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 800/- කි. මෙම මුදල සර්වේයර් ජනරාල් කාර්යාලයේ සරප් කවුන්ටරය වෙත, ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයක් වෙත හෝ දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය). විභාග ගාස්තුව මුදල් ඇණවුම් හෝ චෙක්පත් මගින් භාරගනු නොලැබේ. රිසිට්පත නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

*6. අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සෙ.මී. 21 x සෙ.මී. 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රයක්, පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2018" යනුවෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (විභාග),
විභාග අංශය,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ.පෙ. 506,
කොළඹ 05.

දෙන ලද ආදර්ශ අයදුම්පතට අනුකූලව පිළියෙල කර නොමැති අයදුම්පත් ද, නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ද, ගැසට් නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

8. අයදුම්පත් 2018 මැයි මස 25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

9. ඛණ්ඩාංක පත්‍ර හා ඇඳීම් කඩදාසි විභාග ශාලාවේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් විසින් ඇඳීම් උපකරණ ද, ඛණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදිය ද, අවශ්‍ය අනෙකුත් සියළු උපකරණ ද රැගෙන ආ යුතුය. විභාග ශාලාධිපතිගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

10. (i) සෑම විභාග අපේක්ෂකයෙකුම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත ;

(ආ) වලංගු ගුවන් ගමන් බලපත්‍රයක් ;

(ඇ) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිතව බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්.

(ii) ඉහත 10 (i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2018 මාර්තු මස 13 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ.පෙ. 506,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2018**

විභාග අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම : (මයා/මිය/මෙනෙවිය)
සිංහලෙන් : _______________.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : _______________.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :
සිංහලෙන් : _______________.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : _______________.

(ආ) ස්ත්‍රී/ පුරුෂ භාවය : _______________.
(ඇ) තනතුර : _______________.
(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය : _______________.
(ඉ) ස්ථිර ලිපිනය :
සිංහලෙන් : _______________.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : _______________.

(ඊ) උපන් දිනය :.....................................................................................
(උ) අධ්‍යාපන සුදුසුකම් (සහතික කරන ලද සත්‍ය පිටපත් අමුණා තිබිය යුතුය) : _______________.
(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍යය : සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි
(එ) මුදල් ගෙවූ කාර්යාලය : _______________.
(ඒ) රිසිට්පත් අංකය : _______________.

දිනය : _______________.

(ලදුපත මෙහි අලවන්න)

ම විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බව සහතික කරමි.

_______________.
අයදුම්කරුගේ අත්සන

දිනය : _______________.

03 - 1140